# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2355/11 - 2023 ඔක්තෝබර් මස 23 වැනි සඳුදා - 2023.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි (සංශෝධිත)

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 03/J/84/E/329.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හේවාවිස්ස කෝරළයේ සුළු කොට්ඨාසයේ වැටකේපොත ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අංක මහ 3480 මූලික පිඹුරේ කැබලි අංක 1 සහ 2 වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.623 ක් වූ ඉඩම් කැබැලිවලට මායිම්:

**කැබලි අංකය 01 - (මැදකැකිල) - ප්‍රමාණය: හෙක්. 0.118**

*උතුරට*: මැදකැකිල සහ ගම්සභා මාර්ගය; *නැගෙනහිරට*: ගම්සභා මාර්ගය; *දකුණට*: කැබලි අංක 2; *බටහිරට*: මැද කැකිල.

හිමිකම් කියන්නෝ-

එම්. අයි. සනුන්දීන් (අංක 339/බී, පල්ලේගම, දෙල්තොට), එස්. එම්. බුහාරි (මන්නාරම පාර, පුත්තලම), එස්. එම්. අක්බර් (මන්නාරම පාර, පුත්තලම), එස්. ජෙසිමා (අංක 202, නීලවල පාර, උඩුදෙණිය, මාරස්සන), එස්. ඒ. ලතීප් (අංක 216, වනහපුව, දෙල්තොට), එස්. තාහිරා (අඹකොටුව, පිලීකර, වැටකේපොත), ඒ. ඩබ්. සිත්ති වසීරා (අංක 166/1, වනහපුව, දෙල්තොට), ඒ. ඩබ්. අල් අමීන් (අංක 166/1, වනහපුව, දෙල්තොට).

**කැබලි අංකය 02 - (මැදකැකිල) - ප්‍රමාණය: හෙක්. 0.505**

*උතුරට*: කැබලි අංක 1 සහ ගම්සභා මාර්ගය; *නැගෙනහිරට*: ගම්සභා මාර්ගය; *දකුණට*: මැදකැකිල; *බටහිරට*: මැද කැකිල.

හිමිකම් කියන්නෝ-

එම්. අයි. සනුන්දීන් (අංක 339/බී, පල්ලේගම, දෙල්තොට), එස්. එම්. බුහාරි (මන්නාරම පාර, පුත්තලම), එස්. එම්. අක්බර් (මන්නාරම පාර, පුත්තලම), එස්. ජෙසිමා (අංක 202, නීලවල පාර, උඩුදෙණිය, මාරස්සන), එස්. ඒ. ලතීප් (අංක 216, වනහපුව, දෙල්තොට), එස්. තාහිරා (අඹකොටුව, පිලීකර, වැටකේපොත).

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 දෙසැම්බර් මස 04 වැනි දින පෙ.ව. 10.30ට දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023 නොවැම්බර් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර පරීක්ෂණ දිනයේදී ඔප්පු හා වෙනත් ලියකියවිලි මා වෙත ඉදිරිපත් කළ යුතුය.

**ඩී. ආර්.කේ. හෙන්නායක,**
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0228


1A - G 040578 - 14 (2023/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*